චක්‍රලේඛ අංක :- 06/2019

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක 019, හතර වන මහල,
මහ වීදිය,
බත්තරමුල්ල.
2019/ 01/25

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ
අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**බඳවාගැනීමේ සුදුසුකම්**

**කළමනාකරු (කලාප) III ශ්‍රේණිය - වැ:ප: 103:07/ කළමනාකරු ( පාලන) III ශ්‍රේණිය - වැ:ප: 103:07**

**මුදල් එකතුකරන්නා III ශ්‍රේණිය - වැ:ප: 104:09**

ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් පළ කරමින් නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2019,04/2019 ,05/2019 හා 2019.01.21 දිනැති චක්‍රලේඛන මින් අවලංගු වේ.

02. ඒ අනුව සියළුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සඳහා පහත සඳහන් තනතුරු සඳහා පහත පරිදි සුදුසුකම් අනුමත කරන බව කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

**01. කළමනාකරු (කලාප) III ශ්‍රේණිය - වැ:ප: 103:07**

| | | |
|---|---|---|
| තනතුරේ නම | :- | කළමනාකරු (කලාප) III ශ්‍රේණිය |
| වැටුප් පරිමාණ අංකය | :- | 103:07 |
| සේවා මට්ටම | :- | අධීක්ෂණ |
| අවම වයස් සීමාව | :- | අවුරුදු 24 |
| උපරිම වයස් සීමාව | :- | අවුරුදු 45 |

**තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්**

(අ) 104:08 වැ.ප. ස්ථිර තනතුරක වසර 03 ක් හෝ 104:09 වැ.ප. ස්ථිර තනතුරක වසර 06 ක් හෝ 105:10 වැ.ප. ස්ථිර තනතුරක වසර 10 ක සතුටුදායක සේවා කාලයක් ලබා තිබීම.

හෝ

(ආ) අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් සමත් වීම හෝ සමුපකාර උසස් පෙළ සමත් වීම සමඟ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**02. කළමනාකරු ( පාලන) III ශ්‍රේණිය - වැ:ප: 103:07**

| | | |
|---|---|---|
| තනතුරේ නම | :- | කළමනාකරු ( පාලන) III ශ්‍රේණිය |
| වැටුප් පරිමාණ අංකය | :- | 103:07 |
| සේවා මට්ටම | :- | අධීක්ෂණ |
| අවම වයස් සීමාව | :- | අවුරුදු 24 |
| උපරිම වයස් සීමාව | :- | අවුරුදු 45 |

**තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්**

(අ) 104:08 වැ.ප. ස්ථිර තනතුරක වසර 03 ක් හෝ 104:09 වැ.ප. ස්ථිර තනතුරක වසර 06 ක් හෝ 105:10 වැ.ප. ස්ථිර තනතුරක වසර 10 ක සතුටුදායක සේවා කාලයක් ලබා තිබීම.

හෝ

(ආ) අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් සමත් වීම හෝ සමුපකාර උසස් පෙළ සමත් වීම සමඟ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 05 ක නොඅඩු සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**<u>03. මුදල් එකතුකරන්නා III ශ්‍රේණිය - වැ:ප: 104:09</u>**

| | | |
|---|---|---|
| තනතුරේ නම | :- | මුදල් එකතුකරන්නා III ශ්‍රේණිය |
| වැටුප් පරිමාණ අංකය | :- | 104:09 |
| සේවා මට්ටම | :- | මෙහෙයුම් |
| අවම වයස් සීමාව | :- | අවුරුදු 24 |
| උපරිම වයස් සීමාව | :- | අවුරුදු 45 |

**<u>තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්</u>**

(අ) 105:10 වැ.ප. ස්ථිර තනතුරක වසර 03 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද හෝ 105:11වැ.ප ස්ථිර තනතුරක වසර 06 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම.

හෝ

(ආ) අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් ගණිතය, සිංහල භාෂාව ඇතුළුව විෂයන් 06 කින් සමත් වීම හෝ සමුපකාර සාමාන්‍ය පෙළ සමත් වීම සමඟ අදාල ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම.

එස්.ඒ.එල්.රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත :-

01. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත,
02. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත,
03. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත,
04. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, (කොළඹ, ගම්පහ, කළුතර)
05. අධ්‍යක්ෂක, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය,
06. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව,
07. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්,
08. සියළුම වෘත්තීය සමිති සංගම්,